## කාලය ගෙවුන හැටි

කිසියම් බරපතල වරදකට මිනිසුන් තිදෙනෙකු අවුරුදු 25 ක් තනි තනිව සිරකොට තැබීමට උසාවියෙන් නියම කෙරිණ. හිරගෙදරට පැමිණි විට ඔවුනට සහනයක් වශයෙන් තමන් කැමති එක් දෙයක් පමණක් සිර කාමරයට ගෙන යා හැකි බව ප්‍රධාන ජේලර්වරයා කීය.

පළමු වැන්නා තමාට පොත් ගොඩක් ඇතුළට ගෙනයාමට අවශ්‍ය බව කීය. ඔහුට ඉඩ ලැබිණ. දෙවන්නා කීයේ තම බිරිඳ සිර කාමරයට ගෙන යාමට අවශ්‍ය බවයි. ඔහුටද ඉඩ ලැබිණ. තුන්වැන්නා ඉල්ලා සිටියේ සිගරට් කාටූන් 300 ක් සිරමැදිරිය තුළට ගෙන යාමටය. ඔහුට ද ඉඩ දෙන ලදී.

අවුරුදු 25 ගෙවී අවසාන වූ පසු, පළමු සිරකරු නිදහස් කළ විට පොත් ගොඩද උස්සාගෙන සිරකුටියෙන් පිටතට පැමිණි ඔහු මෙසේ කීවේ ය.

“මේ පොත් මට හරියට ප්‍රයෝජනවත් වුණා. මෙයින් මම හුඟාක් දේ ඉගෙන ගත්තා. මට හරිම සංතෝෂයි. දැන් මගේ අදහස නීතිඥවරයෙක් වීමටයි.”

දෙවැන්නා බිරිඳ හා අළුත්ම දරුවන් හතර දෙනෙකුද සමග එළියට පැමිණ මෙසේ කීවේ ය.

“මමත් මගේ බිරිඳත් ජීවිතයේ මෙපමණ සමීපව සිටි කාලයක් මට මතක නෑ...... දැන් මට ලස්සන දරු පවුලක් ඉන්නවා......මට හරි සතුටුයි......”

තෙවැන්නා සිගරට් ගොඩත් උස්සාගෙන එළියට පැමිණ මෙසේ ඇසී ය.

“මේ.... කවුරු හරි ළඟ නැද්ද අනේ ගිනි පෙට්ටියක්....? ”


## ලිහිණියා LIHINIYA

ලන්ඩනයේ ජනප්‍රිය ශ්‍රීලංකා අවන්හල

වසර 10 ක අඛණ්ඩ සේවය

ප්‍රණීත ආහාර සැපයීමේ පුරෝගාමියෝ

**Buffet Daily £5.00 Weekend £6.50**

එවලේම පිළියෙල කරන ආප්ප, ඉඳිආප්ප, පිට්ටු, රොටි කොත්තු, බුරියානි, ලම්ප්‍රයිස් හා පරාටා

*උත්සව සඳහා ඇණවුම් බාරගනු ලැබේ.*

Tel. 0208 450 9052 / 0208 208 2658

66 Cricklewood Broadway, London NW2 3EP



## ZOOM VISION VIDEO

Broadcast quality wedding video

- Use of broadcast quality 3 chip digital camera by a qualified videographer.
- Editing with Avid Digital Non-linear system.
- Montage or music video of your choice.
- DVD and VHS copies of the edited master.
- Coverage of Eastern & Western weddings.
- We also cover birthday parties, social functions, other special occasions.



T- 020 8590 6034 Mob. 07859000421



වසර ගණනාවක් පුරා ශ්‍රීලාංකික ජනතාවගේ හදවතට වඩාත් සමීපව කටයුතු කරන නැව් බඩු ආයතනයයි

## සත්සමුදුර ජයගත් ට්‍රයිකෝ

♦ ට්‍රයිකෝ - කොළඹ

50 සිරිල් සී පෙරේරා මාවත

කොළඹ 13

දුරකතනය 448270 / 432236

♦ ට්‍රයිකෝ - ගාල්ල ♦ ට්‍රයිකෝ - කුරුණෑගල

සතියක් ඇර සතියක්, එනම් මසකට දෙවරක් ට්‍රයිකෝ නැව්බඩු ලංකාවට යැවේ. දින 17 කින් ඒවා ලංකාවට ළඟාවේ.

## TRICO
## Shipping & Forwarding Ltd

555 White Hart Lane
London N17 7RP

Telephone 0208 888 8787
Fax 0208 889 5445
E-Mail : trico@tricoshipping.com

*නැව්බඩු සඳහා පූර්ණ විශ්වාසය තැබිය හැකි ආයතනය*




## ඇසින් දුටු සාක්ෂි

නිව්යෝර්ක් නගරයේ බැංකුවකට ඇතුල්වුණු මංකොල්ල කරුවෙක් පිස්තෝලයක් ඇද කැෂියර්ගෙන් මුදල් ඉල්ලී ය. කැෂියර් ඔහුට ලාච්චුවේ ඇති මුදල් සියල්ල දුන්නේ ය. ඔහු එයද රැගෙන යන්නට සැරසී, එහි සිටි පාරිභෝගිකයෙකුගෙන් මෙසේ ඇසී ය.

“ ඕයි! තමුසෙ දැක්කද මං දැන් සල්ලි මංකොල්ල කනවා...? ”

“ඔව් සර් මං දැක්කා....” මිනිසා කීවේය.

හොරා එකෙණෙහිම ඒ මිනිසාට වෙඩි තැබීය. ඔහු මැරී වැටුණේය. හොරා ඊළඟට එතැන සිටි තවත් මැදි වයසේ ජෝඩුවක් වෙතට හැරී, සැමියාගෙන් ප්‍රශ්න කළේ ය.

“තමුසෙ දැක්කද මං දැන් බැංකුව මංකොල්ල කනවා.....? ”

සැමියා මෙසේ පිළිතුරු දුන්නේ ය.

“ මං නම් දැක්කෙ නෑ......මගේ වයිෆ්ප් දැක්කා.....”

## ඉරද? හඳද?

**ගුරුතුමිය:** ඇම්ඩන් කියන්න අපිට වැඩිම සේවයක් වෙන්නෙ ඉරෙන්ද? හඳෙන්ද?

**ඇම්ඩන්:** හඳෙන් මිස්

**ගුරුතුමිය:** මොකද එහෙම කියන්නෙ.....?

**ඇම්ඩන්: :** මිස් රෑට හඳ පෑව්වම කලුවර නැතිවෙලා යනවා.... ඒත් දවල්ට ඉර පෑව්වම ඒකෙන් ඇති වැඩක් නෑ.... කොහොමත් දවල්ට හොඳට එළිය තියෙනව නේ....

## ලෝකෙට ආපු හේතුව

දිනක් ඇම්ඩන්ට හොඳ ගුණ ධර්ම පුරුදුකරගැනීමේ වැදගත්කම ගැන දේශනාවක් කරමින් සිටි පියා කතාව අවසන් කළේ මෙසේ ය.

“පුතේ හොඳට මතක තියා ගන්න..... අපි මේ ලෝකෙට ඇවිල්ලා ඉන්නෙ අනුන්ට උදව් කරන්න......”

ඇම්ඩන් තාත්තාගෙන් මෙසේ ඇසීය.

“එතකොට තාත්තෙ අනික් අය මොකටද මේ ලෝකෙට ඇවිල්ලා ඉන්නෙ.....?”

## හද පැලී මියයෑම

රෝහිණී ආදරේට කූඩුවක දමා ගිරවෙකු ඇති කළාය. ඇය ගිරවාට කවන්නීය, පොවන්නීය. ඉතා ආදරේය. මේ කාලයේ රෝහිණීගේ විවාහ මංගල්‍යය සිදුවීය. රෝහිණී කැන්දා ගෙන ගිය දාට පසුවදා ගෙදර අය දුටුවේ ගිරවා කූඩුව තුළම මැරී වැටී සිටින හැටි ය.

මේ පුවත අසා අල්ලපු ගෙදර මැගිලින් නැන්දා පැමිණ රෝහිනීගේ නංගී වන කාන්ති සමග කතා කරමින් විස්තර ඇසුවාය.

**මැගිලින් නැන්දා :** හැබෑද දූවේ මේ රෝහිණී කෙල්ල කැන්දන් ගියාම ගිරවා මැරුණයි කියන්නෙ?

**කාන්ති :** ඔව් නැන්දෙ අනේ ඌ මැරුණ නේන්නම්

**මැගිලින් නැන්දා :** ඔය රෝහිණී ගිය සාංකාවට..... තිරිසනා වුනත් ආදරයක් ඇතිවුනාම ඔහොම තමයි.... පෙර ජාතියෙ පතාගෙන ආ හැටි නෙව.... අපෝ ඌට දරන්න බැරි දුකක් ඇති වෙලා හර්ද වස්තුව පැලිලා මැරෙන්න ඇති....

**කාන්ති :** කවුරුත් හිතන්නෙ එහෙම තමයි....හැබැයි ඇත්තටම නැන්දෙ මේකයි වුනේ......

**මැගිලින් නැන්දා :** ඒ මොකක්ද බං ?

**කාන්ති :** මගුල් ගෙදර තිබ්බ්ච කලබලේ හැටියට ඒ දවස් ටිකේම කාටවත් මතක් වුනේ නැහැ, ගිරවට කන්න දෙන්න වත්... වතුර දෙන්න වත්....

## කෙස් වැටෙනවට බෙහෙත

මිනිහෙක් හිසකෙස් විශේෂඥ දොස්තර කෙනෙකු ළඟට ගොස් මෙසේ කීවේය.

“මගේ හිස කෙස් හෝ ගාලා වැටෙනව. ඒකට මොනව හරි දෙන්න පුළුවන්ද? ”

දොස්තර ඔහුට හිස් කාඩ්බෝඩ් පෙට්ටියක් දුන්නේ ය.


Community Legal Service

# ANTONS
## SOLICITORS

**Community Legal Service**

**For Quality Services**

We offer a comprehensive range of Legal Services.

| Conveyancing | Immigration |
|---|---|
| ♦ Sale & Purchase | ♦ Asylum cases |
| ♦ Right to buy (Council House) | ♦ Asylum Application |
| ♦ Re-Mortgage | ♦ Judicial Reviews |
| ♦ Assignment of Lease | ♦ Extensions of Visas |
| ♦ New Lease | ♦ Marriage Applications |
| ♦ Licensing Applications | ♦ Work Permits |
| ♦ Contractual Disputes | ♦ Business Visas |

*For a fee of £299 for Residential, £599 for Commercial excluding vat & disbursement*

***Contact -*** **Mrs Rani Bulathwela 07808158360**
**Rohitha – 07956549447 Nihal – 07930310967**
**Vajira – 07887840227**

## ANTONS SOLICITORS

**14 Wordsworth House, Wordsworth Parade**
**London N8 0SJ**
Tel. 0208 888 6211 Fax 0208 888 1403
***E-mail :*** **antons.solicitors@btopenworld.com**



ලංකා විත්ති පුවත්පතේ පළවන ලිපි, අදහස් හා දැන්වීම් ඒවා පළකරන අයගේය. ඒ ගැන කර්තෘගේ කිසිදු වගකීමක් නැත.

**ලංකාවිත්ති පත්‍රය අවුරුද්දක් ඔබේ ගෙදරට ගෙන්වාගන්නට පවුම් 10 ක චෙක්පතක් පහත ලිපිනයට එවන්න**

**Lanka Viththi, P.O.Box 14373, London NW6 3WU**




**An unusual wedding and the happy couple: Crossbreed Foxy was married to guide dog labrador Saul**

# A canine marriage

# බලු යුවල කසාද බඳිති

## You may now sniff the bride's bottom….

The groom had a wet nose and the bride had hairy legs but it was still a fairy-tail wedding.

Smitten pooches Saul and Foxy exchanged rubber rings in front of 35 canine and human guests, in Brockworth, Glouster. The bride's 'father' 23 -year-old student Bob Bonwick, said it was love at first bite for the pair, who met a year ago during a walk. He added, " I have never seen two dogs play as well as they do."

The Rev. Keith Corless conducted the blessing in the garden of the groom's owner Mike Kelly, and the happy couple are now enjoying married life in the village.

Civil servant Mr Kelly, 51, said: ' It was a great day but I have told Saul that, if it doesn't work out, we can always file for an annulment.' - **London Metro**

එංගලන්තයේ ග්ලොස්ටර්ෂයර් හි බ්‍රොක්වර්ත් නම් පෙදෙසේ බල්ලෙකු සහ බැල්ලියක අතර විවාහය මිනිස් සහ බලු හිතවතුන් 35 කගෙන් සමන්විත පිරිසක් ඉදිරියේ උත්සවාකාරයෙන් සිදුකිරීමේ පුවතයි මේ.

ෆොක්සි නමැති බලු මනාලිය සහ සාවුල් නමැති බලු මනාලයා එහිදී රබර් මුදු හුවමාරුකරගත් අතර ඒ පළාතේ ක්‍රිස්තියානි පූජකතුමා විසින් විවාහ චාරිත්‍ර යථාපරිදි ඉටුකරන ලදී. බලු මනාලියගේ **'පියා'** වශයෙන් ඉදිරිපත්ව සිටියේ 23 හැවිරිදි ශිෂ්‍යයෙකු වූ බොබ් බොන්වික්ය. මනාලයාගේ අයිතිකරු සිවිල් සේවකයෙකු වන මයික් කෙලීය. සාවුල් හා ෆොක්සි මුලින්ම හමුවූ දා එකිනෙකා කෙරෙහි දැඩි ප්‍රේමයෙන් බැඳුණු බවත් ඔවුන් දෙදෙන වෙන් කළ නොහැකි තරම් සමීප වූ නිසා මෙසේ විවාහකර දුන් බවත් අයිතිකරුවෝ රැස්ව සිටි අමුත්තන් පිරිසට පැවසූහ. මෙම උත්සවය පැවතියේ මනාලයාගේ අයිතිකරුගේ නිවසේ පිටුපස එළිමහනේ ය.

මෙම බලු මංගල්‍යය සඳහා ආරාධනා පත්‍රයක් ද මුද්‍රණය කර තිබිණ.